# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE) හා සේෆ් ෆවුන්ඩේෂන් (SAFE Foundation) ආයතනය එක්ව සාත්තු සේවිකාවන් 100 නොමිලේ පුහුණු කිරීමේ වැඩසටහන

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE) හා සේෆ් ෆවුන්ඩේෂන් (SAFE Foundation) ආයතනය එක්ව සාත්තු සේවිකාවන් 100 දෙනෙකු නොමිලේ පුහුණු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

ඊශ්‍රායලයේ නිවාස පාදක සාත්තු සේවිකාවන් වැඩි වශයෙන් යොමු කිරීම අරමුණු කර ගනිමින් පවත්වන මෙම වැඩසටහන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පුහුණු මධ්‍යස්ථානයන් හිදී පවත්වනු ලැබේ.

මේ සඳහා පහත සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

* වයස අවුරුදු 25 - 44 ත් අතර විදේශ රැකියාවක නිරතව මෙරට පැමිණි කාන්තාවක් වීම.
* අවම උස 1.5 m, අවම බර 45 Kg.
* මීට පෙර ඊශ්‍රායලයේ සේවය කර නොතිබීම.
* කාලත්‍රයා දැනට ඊශ්‍රායලයේ සේවය නොකිරීම.
* අ.පො.ස උ.පෙළ දක්වා අධ්‍යාපනය ලබා තිබීම.
* චෝදනාවලින් තොර පිරිසිදු පොලිස් වාර්තා තිබීම.
* ශාරීරික හා මානසිකව නිරෝගී විය යුතු අතර ක්ෂය රෝගය, සෙංගමාලය, ගොනෝරියාව, HIV ඒඩ්ස් යන රෝග ඇතුළු (නමුත් මේවාට පමණක් සීමා නොවූ) නිදන්ගත රෝග වලින් නොපෙළෙන ලොකු බරක් ඉසිලීමේ හැකියාව ඇති ඊශ්‍රායලයේදී අසීරු අන්දමේ සාත්තු සත්කාර කිරීමේ හැකියාව තිබිය යුතුය.

කාර්යාංශයේ පුහුණුව නිම කරන අයවලුන්, සාත්තු සේවය සඳහා වූ ජාතික ඇගයීම් නිපුණතා මට්ටම III (NVQ III) වෙත යොමු කරන අතර ඉන් සමත් වන අයවලුන් ඊශ්‍රායලයේ නිවාස පාදක සාත්තු සේවක තනතුරු සඳහා යොමු කෙරේ. මෙම තනතුර ලොතරැයි ක්‍රමයක් මගින් තෝරාගනු ලබන බැවින් පුහුණුව සාර්ථකව නිම කිරීම ඊශ්‍රායලයේ සාත්තු සේවා රැකියාවක් ලබා ගැනීමේ මූලික සුදුසුකමක් වනු ඇත.

ඔබගේ අයදුම්පත කළමණාකරු (පුහුණු -ගෘහස්ථ), ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය 553/1, නව නුවර පාර, තලංගම උතුර, බත්තරමුල්ල යන ලිපිනයට හෝ mgr_trdomestic@slbfe.lk ඊමේල් ලිපිනයට යොමු කරන්න.

නැත්නම් ළඟම පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාලයකට ලබා දෙන්න.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය : 2022.08.15 වේ.

**සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

***එතෙර සවියට මෙතෙර අත්වැල***